# යේසුස්වහන්සේගේ උපත

-The Birth of Christ-

www.kidworship.kr



10Page

**පොතේ ගුරා** බොහෝ කාලයකට පෙර ගලීලයේ නාසරෙත් නම් කුඩා නුවර දුප්පත් තරුණියක් සිටියා. ඇය කන්‍යාවියක්. ඇගේ නම මරියා. ඒ වනවිට මරියා විවාහය පිණිස විවාහ ගිවිසගෙන සිටියේ වඩුකාර්මිකයෙක් ලෙස රැකියාව කළ, ඉතා කරුණාවන්ත හදවතක් තිබූ යෝසෙප් නම් තරුණයෙක් සමගයි.

ඒ කාලයේදී ඉශ්‍රායෙල් හී රජකම් කරන ලද්දේ හෙරොද් නම් රජතුමාය. ඔහු පැමිණියේ අසල්වාසී රාජ්‍යයකින්ය. මේ හෙරොද් රජතුමාගේ රාජ්‍යය පාලනය යටතේ ඉශ්‍රායෙල් මිනිසුන් අපමණ දුක් වින්දේය. ඒත් ඉශ්‍රායෙල් සෙනග ඔවුන්ට දෙවියන්වහන්සේ විසින් දුන් පොරොන්දුව මතකයේ තබාගෙනම සිටියා.

**මිනිස්සු** අපි වෙනුවෙන් කුඩා ළදරුවෙක් උපදින දවසක් එනවා. එයා අපිව නිදහස් කරනවා. ඒ වගේම එයා අපේ ගැළවුම්කරුවා වී අපව මුදා ගන්නවා.

.......................................................................................................................



11Page

**පොතේ ගුරා** එක්තරා රාත්‍රියක දී මරියා නිදාගෙන සිටියදී හදිසියේම ගාබ්‍රියෙල් නම් දේවදූතයා ඇය ඉදිරියේ ප්‍රකාශ වුණා.

**ගාබ්‍රියෙල් දේවදූතයා** මරියා භය නොවන්න... දෙවියන්වහන්සේගේ ආශීර්වාදය ඔබ කෙරෙහි තබා තිබෙනවා. ඔබට උන්වහන්සේගේ කරුණාව ලැබී තිබෙනවා. ඔබ ශුද්ධාත්මයාණන් කරණකොටගෙන ගර්භණී වී පුත්‍රයෙක් බිහිකරන්න යනවා. ඔහුට යේසුස් කියා නම තබන්න. දෙවියන්වහන්සේ විසින් ඔහුට දාවිත්ගේ සදාකාලික සිංහාසනය උරුම කරදීමටත් යනවා.

**මරියා** ඒත්... (පුදුමයෙන්) මම තාම් විවාහ වෙලා නෑනේ... මේක කොහොමද වෙන්නේ? දරුවෙක් ලැබෙන්නේ කොහොමද?



12Page

**ගාබ්‍රියෙල් දේවදූතයා** ඒ දරුවා මනුෂ්‍යයෙක්ගෙන් උපන්නෙක් නොව දෙවියන් වහන්සේගේ බලයෙන් උපදින පුත්‍රයෙක්. ඔහු දෙවියන්වහන්සේගේම පුත්‍රයා වන්නේය.

**පොතේ ගුරා** මරියා භය වුණා. ඒත් ඇය දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරමින් උන්වහන්සේට කීකරු වුණා.

**මරියා** ස්වාමිනී ! මම ඔබවහන්සේගේ දාසිය ය. ඔබවහන්සේ නියමකරගත් හැටියටම එය සිද්ධ වේවා !

**පොතේ ගුරා** එය භය හිතෙන දෙයක්. මන්ද කීවොත් ඒ කාලයේ විවාහ නොවූ කාන්තාවක් ගර්භණීව දරුවෙක් පිළිසිඳ ගත්තොත් ගල් ගසා මරනු ලබන්නට නියමව තිබුණා. එසේම මරියා විවාහ වීමට නියමිතව සිටි යෝසෙප් ඇයව අත්හරින්නටද පුලුවන්කමක් තිබුණා. ඒත් මෙම අවධානම් මෙසේ තිබියදී පවා මරියා කීකරු වී දෙවියන්වහන්සේට ස්තූති ප්‍රශංසා කළා.



13Page

**යෝසෙප්** ආහ්.... කොහොමද මේක වෙන්නේ ? මරියා මාව විවාහ වෙන්නත් කලින් දරුවෙක් ලැබෙනවා... ඒක කොහොමද මරියා ? මේක වේදනාත්මක වැඩියි... හ්ම්... (දිගු හුස්මක් ගනී).

**පොතේ ගුරා** මරියා විවාහ තීන්දු වී සිටිය යෝසෙප් හරිම කරුණාවන්ත, ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක්. ඒ වුණත් විවාහයට පෙර මරියා දරුවෙක් පිළිසිඳ ගැනීම නම් ආරංචිය ඔහුට දරන්න බැරි තරම් පුදුමයක් වුණා. යෝසෙප් මෙහෙම සිතුවා, මම ගිහින් කියනවා... "මරියා මට ඔයාව විවාහ කරගන්න වෙන්නේ නෑ... " යි කියා. මෙහෙම ඉද්දී දවසක් දේවදූතයෙක් යෝසෙප්ට දර්ශනය වුණා.

**දේවදූතයා** දාවිත්ගේ පුත්‍ර වූ යෝසෙප්... මරියා පාවා ගන්න භයනොවන්න. ඈ තුළ පිළිසිඳගත්ත දරුවා දෙවියන්වහන්සේගෙන් ය. ඇය බිහිකරන පුත්‍රයාට යේසුස් කියා නම් තබන්න. ඔහු තමන්ගේ සෙනග පාපයෙන් ගළවන්නේ ය.

**යෝසෙප්** ආහ්.... දැන් මට තේරුණා...

.................................................................................................



14Page

**පොතේ ගුරා** දේවදූතයා කියූ දේ ඇසූ යෝසෙප්, ඔහු පොරොන්දු වූ ආකාරයටම ගොස් මරියා මුණගැසී ඇයව විවාහ කරගත්තා. ඊට මාස කිහිපයකට පසුව සංගණනයක් පිණිස හැමකෙනෙක්ම තම තමුන්ගේ නුවරවලට යන්නැයි කියා, රෝම අධිරාජ්‍යාගේ නියෝගයක් නිකුත් වූයෙන් යෝසෙප් ගර්භණීව සිටය මරියා සමගින් තමුන්ගේ ගමට යන්න පිටත් වුණා. ඔවුන් යද්දී ප්‍රමාද වූ අතර, ජනතාව බොහෝ ඇවිත් සිටිය හෙයින්ද මගදී ඔවුන්ට නවතින්නට ස්ථානයක් සොයගැනීම අසීරු වුණා.

**යෝසෙප්** ඔයාලට වැඩිපුර කාමරයක් තියෙනවාද? මගේ භාර්යාවට දරුවා ලැබෙන්න ආසන්නයි. කරුණාකර පොඩි කාමරයක් හරි කමක් නෑ...

.................................................................................................



15Page

**පොතේ ගුරා** ඔවුන්ට එදා රෑ නවතින්න තැනැක් හොයාගන්න බැරි වුණා. අන්තිමට ඔවුන්ට ලැබුණේ අශ්වයන් නිදාගන්න ගාලක්. ඒ රාත්‍රියේදී බිළිඳාගේ උපත සිදුවුණා. ඒ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ය. දෙවියන්වහන්සේගේ පුත්‍රයා ය. උන්වහන්සේ තමුන්ගේ සෙනග පාපයෙන් ගළවන්නේ ය.

**ජීවිතයට අදාල කිරීම** දුවේ පුතේ, මෙන්න අපිටත් ගැළවුම්කාරයෙක් ! අපේ පව්වලට සමාව දෙන ගැළවුම්කාරයෙක් ! හොඳ ආරංචියක් නේද? බොහෝදෙනා පාපය, වරද නිසා දුක්විඳිනවා නේද? අපි මේ ගැළවුම්කරුවාණන් වන යේසුස්-වහන්සේ ගැන ඒ අයට කියමු.